## බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2018
-------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ ප්‍රමිත 7හි 69 ඡේදය අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භවන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත්වීමෙන් පසුව වුවද සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් වත්කම් එපරිදි ක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු. 516,568 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ගැනීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 වර්ෂයේදී නල ළිඳක් තැනීමේ කාර්යය අසාර්ථක වීම හේතුවෙන් දරන ලද රු . 364,255ක මුදල,වියදමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ගැනීමට සටහන් කර ගතිමි. | ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වැය , අදාල ව්‍යාපෘතිය අසාර්ථක වීමේදී වියදමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ආ) විද්‍යායතනය 2015 ජනවාරි සිට 2017 මැයි දක්වා සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් නොගෙවීම හේතුවෙන් පිළිවෙලින් රු.758,119 ක් හා රු.128,682 ක අධිභාර මුදල් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් ප්‍රතිපූර්ණය කර තිබුණි. එම අධිභාර මුදල වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට හා සේවක භාරකාර අරමුදල් ගිණුමට හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් වියදම් එම ප්‍රමාණයන්ගෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | අධිභාර මුදල් වියදමක් ලෙස වෙනම හඳුනාගත යුතු අතර නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ අරමුදල් එහි අරමුණු වලට පරිබාහිර කාර්යයන් වෙනුවෙන් නොදැරිය යුතුය. |
| (ඇ) 2015 වර්ෂයේදී නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් විද්‍යායතනයට ලබා දී තිබූ ස්ථාවර වත්කම් 56 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | පළමු අයිතම 07 සඳහා තොරතුරු ලැබී ඇති අතර ඉතිරි අයිතම 03 සඳහා තොරතුරු ලැබී නොමැත. | සියළුම වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික වෘත්තීය සුදුසුකම 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමේ අරමුණින් පිහිටුවන ලද මෙම විද්‍යායතනයේ, දේශකවරුන් වෙත දීමනා ගෙවීමේ දී විධිමත් අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල හා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 7 පාඨමාලා සඳහා පමණක් භාවිතා කල හැකි පරිදි නිකුත් කර ඇති චක්‍රලේඛ පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුල දීමනා ලෙස රු.4,850,250ක් ගෙවීම් කර තිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ කිරීමේදී NVQ 06 පාඨමාලා වලට අදාළ විශේෂ චක්‍රලේඛ නොමැති හෙයින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 954 චක්‍රලේඛය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/1670 දරන චක්‍රලේඛ ලිපියේ සඳහන් ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදුකර ඇත. | චක්‍රලේඛ විධිවිධාන නොමැති අවස්ථා වලදී විධිමත් අනුමැතීන් මත ගෙවීම් සිදුකල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.123,826,115 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ වන විට පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ට දීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළ විභාග කටයුතු වෙනුවෙන් රු.520,455 ක දීමනා ගෙවා තිබුණි. | විගණන විමසුම පිළිනොගනිමි.<br><br>ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීම, පිළියෙල කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයකට අනුව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් ලබා ගන්නා ලද චක්‍රලේඛයකට අනුව ගෙවීම් කටයුතු සිදු කරන ලදී. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,113,319 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,130,240 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,016,921 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මුළු මෙහෙයුම් වියදම් රු. 21,829,439 කින් වැඩි වී තිබුණද පුනරාවර්තන ප්‍රදාන හා විලම්භිත ආදායම් ක්‍රමක්ෂය රු. 24,494,831 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුව වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය ස්ථාපිත කර තිබූ ජාතික තරුණ සේවා සභාවට අයත් අක්කර 5ක ඉඩම විගණිත දිනය වූ 2019 මාර්තු 24 වන විටත් විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර අදාළ අංශ සමඟ ඒ සඳහා කටයුතු කර ඇත. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කිරීම වැදගත් වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ පාඨමාලාවට අදාලව ඇතැම් විෂයයන් (Module) සම්බන්ධයෙන් ආවරණය කල යුතු යැයි සැලසුම් කල දේශන පැය ප්‍රමාණය දේශකයන් විසින් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් සිසුන්ට ලැබෙන විෂය දැනුමේ ප්‍රමාණාත්මකතාවය හා පාඨමාලාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකිවිය. | විෂයයන් වලට සම්බන්ධ ආවරණය කළයුතු දේශන පැය ගණන් විෂය මාලාවේ සඳහන්ව පවතින නමුත් සමහර විෂයන්වලට අදාළව විෂය මාලාවේ සඳහන් වන දේශන පැය ප්‍රමාණයන් ප්‍රායෝගික නොවේ. සමහර අවස්ථාවන් හීදී විෂය මාලාවේ සඳහන් වන පරිදි දේශන පැය ප්‍රමාණයන් පවත්වනු ලබන අතර ඇතැම් අවස්ථා වලදී විෂය මාලාවේ සඳහන් පැය ගණන ඉක්මවා ඉගැන්වීම් කටයුතු සිදුකර ඇත. | සැලසුම් පිලියෙල කිරීමේදී පැවැත්විය යුතු දේශන පැය ප්‍රමාණය පිලිබඳ අවධානය යොමු කිරීම කල යුතුය. |
| (ආ) ඉදිකිරීම් තාක්ෂණය සහ ප්‍රමාණ සමීක්ෂණය යන පාඨමාලා සඳහා නිර්දේශ කර තිබූ Wood Craftsman Practices යන විෂය ඉගැන්වීම සඳහා කථිකාචාර්යවරයෙකු විද්‍යායතනයේ නොවීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට එම විෂයය ඉගැන්වීම් කටයුතු සිදුකර නොතිබුණි. | Wood Craftsman Practice යන විෂය 2016,2017 හා 2018 ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ප්‍රවීනයකු සොයා ගැනීමට තිබූ අපහසුතාවය නිසා එම විෂය සම්බන්ධ ඉගැන්වීම් කර නොතිබුණු බව පිළිගනිමි. | පාඨමාලාවන්හි නිර්දේශිත විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය පරිදි කථිකාචාර්යවරු බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) විද්‍යායතනය විසින් 2017 බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායමේ පදනම් විභාගයට අදාලව සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද විභාග ප්‍රතිඵලවලට අනුව පාඨමාලා 02කට අදාලව විෂයයන් 02කින් කිසිදු ශිෂ්‍යයෙකු සමත්ව නොතිබුණු අතර පාඨමාලා 06කට අදාලව විෂයයන් 17කින් සිසුන්ගේ සමත්වීම සියයට 06 සිට සියයට 61 දක්වා වූ පරාසයක පැවතුණි. | පදනම් පාඨමාලාවට අදාළ විභාගයෙහි විභාග ප්‍රතිඵලයන්හි සමත්වීමේ ප්‍රතිශතය අඩු වීමට මූලික හේතුව වන්නේ ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුමේ ඇති අඩුපාඩුව පිළිබඳ ඇති ගැටළුවයි. මෙම ගැටළුව විසඳීම සඳහා මූලික පියවරක් ලෙස ඉංග්‍රීසි විෂය සඳහා සවස්වරු පන්ති (Evening Classes) ඉංග්‍රීසි භාෂා උපදේශකතුමිය විසින් පවත්වාගෙන යනු ලබයි. | සිසුන් සමත්වීමේ ප්‍රතිශතය ඉහළ නංවා ගැනීමට අදාල පියවර ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂය තුල මිලදීගත් හා 2015 නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ එකතුව රු.722,261ක් වටිනා උපකරණ භාවිතා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | ප්‍රායෝගික පුහුණුවන්හිදී අංග සම්පූර්ණ මුළුතැන්ගෙයක් සහ නාන කාමරයක් පිළියෙල කිරීම සඳහා (Restaurant & Bathroom) ව්‍යාපෘති වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br><br>කළමනාකරණ තොරතුරු පද්ධතිය යනු භෞතික උපාංග පද්ධතියක් නොවේ. එය නිපුණතා ආංශික සංවර්ධන අංශය (SSDD) සහ කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණුව (TVET) ආයතනය සම්බන්ධීකරණය කරමින් මාර්ගගත ක්‍රමයට ගොඩනගා ඇති කළමනාකරණ තොරතුරු පද්ධතියකි.එයට අන්තර්ජාලය හරහා ඕනෑම උපාංගයකින් ප්‍රවේශ විය හැකිය. ඒ සඳහා නිශ්චිත පරිගණකයක් හෝ ස්ථානයක් වෙන් කිරීම අවශ්‍ය නොවේ. | වත්කම් උපරිම කාර්යක්ෂම තාවයෙන් හා ඵලදායීව අරමුණුගත කාර්ය සඳහා යොදාගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 21 දිනැති අංක ඩීඑම්එස්/1670 දරන කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අවම සුදුසුකම් සපුරා නොතිබූ ආධුනික කථිකාචාර්යවරුන් 03 දෙනෙකු 2016 හා 2017 වර්ෂයන්හිදී බඳවා ගෙන තිබුණි. | විද්‍යායතනයට අදාළව 2016 හා 2017 වර්ෂයන්හි බඳවා ගත් ආධුනික කථිකාචාර්යවරුන් 2ක් මේ වනවිට සේවා ස්ථිරත්වය සඳහා වන පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා යොමුකර ඇති අතර ඉතිරි කථිකාචාර්යවරිය මේ වර්ෂය තුළ එම කටයුතු සඳහා යොමුකිරීමට අපේක්ෂිතය. | බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදුකළ යුතුය. |
| (ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල ප්‍රදර්ශක තනතුරු 05ක් පැවතියද විගණිත දිනය වූ 2019 මැයි 15 දක්වාම එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමේ කටයුතු මේ වනවිට ආරම්භ වී ඇත. | තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිතව තිබූ ශ්‍රවනාගාරයේ විවිධ කාර්යයන් 04ක් ඉටු කිරීම වෙනුවෙන් රු .මිලියන 2.8ක මුදලක් වෙන් කර තිබුණ ද වර්ෂය තුල අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි. | ශ්‍රවණාගාරය පුළුල් නොකිරීම හේතුවෙන් එම කාර්යයන් ඉටු නොකෙරුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සිදුකළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා මාස 3කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් විද්‍යායතනය එපරිදි කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ පෙන්වා ඇති පරිදි 2017 වසරේදී විගණන කමිටුවක් පත් කර ගැනීම සඳහා අභ්‍යන්තර නිලධාරියෙක් පත් කිරීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමියගෙන් ඉල්ලීමක් කර ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |